IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය

# අධ්‍යක්ෂ තනතුර

කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය, 2021 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අංක 1 නියමාවලියේ 5(1) වගන්තිය සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24(ඒ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සහ ඊට අදාළ ඉන් පසු කරන ලද සංශෝධන අනුව මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්/ නාමයෝජනා කැඳවනු ලැබේ.

අදාළ අයදුම්කරුවන්/ නම් කළ අයවලුන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. සාර්ථක අයදුම්කරුවන්/ නම් කළ අයවලුන් අදාළ තනතුරෙහි පත්වීම ලද දින සිට වසර 3 ක් හෝ ඔහු/ ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ කරන තුරු රාජකාරි කළ යුතු අතර, ඉන් පළමුවෙන් එළඹෙන අවස්ථාව බලාත්මක වනු ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනය (මාසඅආ) යනු කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබන ආයතනයකි. වර්තමානයේ මෙම ආයතනය විසින් කොළඹ විශ්වවිද්‍යාලය මඟින් ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි හා උපාධි අධ්‍යයනයන් සඳහා අවස්ථාවන් සම්පාදනය කරනු ලබන අතර, ඩිප්ලෝමා හා සහතික පත්‍ර වැඩසටහන් පවත්වනු ලබයි. මාසඅආ (IHRA) ශිෂ්‍ය ප්‍රජාව, ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ, දැනට රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සේවයේ නියුක්ත වූවන්ගෙනි. තවද මෙම ආයතනය පර්යේෂණ හා උපදේශන සේවාවල ද නිරතව සිටී.

අධ්‍යක්ෂවරයා ආයතනයෙහි පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, අධ්‍යයන හා පරිපාලන ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි. එසේම ඔහු/ ඇය ආයතනයේ ගිණුම්කරණ නිලධාරියා ද වන අතර, ආයතනයේ පාලනාධිකාරය වන කළමනාකරණ මණ්ඩලයේ (Board of Management) නිලබලයෙන් පත් වූ සාමාජිකයෙක් මෙන්ම සභාපතිවරයා ද වේ. අධ්‍යක්ෂවරයාගේ රාජකාරිය වන්නේ විනිවිදභාවය හා වගවීම් පවත්වා ගැනීම වන අතර අධ්‍යයන නායකත්වය ලබාදීමේ වගකීම ද දරයි. එසේම, ඔහු/ ඇය ආයතනය ඇතුළත විනය පවත්වා ගැනීම පිළිබඳ වගකීම ද දරයි. ඔහුට/ ඇයට ආයතනයේ සේවාදායකයින්ගේ සහ කාර්යය මණ්ඩලයේ අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් තිබිය යුතු අතර අරමුදල් උත්පාදනය කිරීමටත් විශ්වවිද්‍යාල-ආයතන හා කර්මාන්ත අතර සහයෝගිතාව වර්ධනය කිරීම මෙන්ම අධ්‍යයන කටයුතු පිළිබඳ ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කිරීමටත් හැකි විය යුතුය.

අධ්‍යක්ෂවරයා, ඔහුගේ/ ඇයගේ බුද්ධිමත්භාවයේ මෙන්ම කළමනාකාරීත්ව බුද්ධි ප්‍රභාව තුළින් ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට සමත් දැක්මක් ඇති අයකු විය යුතුය. අයදුම්කරු/ නම් කළ අය, ඉහළ අධ්‍යයන පන්නරයක් හා ඒකාග්‍රතාවයක් ඇති ඉහළ පර්යේෂණ ප්‍රකාශන අංශ දර්ශකයක්, සනාථ කළ නායකත්ව ගුණාංගයන් සහ ඉහළ තලයේ අන්තර් පුද්ගල නිපුණතාවයෙන් යුත් අයෙක් විය යුතු අතර ප්‍රතිපත්ති සහ ගැටලු සම්බන්ධව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය.

මෙම තනතුර සඳහා මහාචාර්යවරයෙකුගේ වැටුප සමඟ තනතුරට අදාළ අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

අදාළ අයදුම්පත්/ නාමයෝජනා සමඟ පහත සඳහන් ලේඛන තිබිය යුතුය.

(I) අයදුම්කරුගේ/ නම් කළ අයගේ උපන්දිනය සමඟ සම්පූර්ණ ජීව දත්ත (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් අනිවාර්යයෙන් අමුණා තිබිය යුතුය.)
(ii) ආයතනයේ සංවර්ධනය උදෙසා දැක්මේ ප්‍රකාශයක්
(iii) අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබුවහොත්, ඔහු/ ඇය සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු සම්බන්ධව කෙටි විස්තරයක්
(iv) නම් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන්, අදාළ අයදුම්කරුගේ එකඟතාව පළකරන ලිපියක්
(v) මානව සම්පත් අභිවර්ධන ආයතනය හැර රාජ්‍ය අංශයේ, සංවිධානවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවන්/ නම් කළ අයවලුන් සිය සේවායෝජක වෙතින් ඔහු/ ඇය මෙම තනතුරට පත්කර ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි ද යන කරුණු සඳහන් ලිපියක් ඉදිරිපත් කළ යුතුයි

තෝරාගැනීමේ ක්‍රමවේදය 2020 සැප්තැම්බර් 11 වන දිනැති අංක 07/2020 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව ලබා දී ඇති උපදෙස් නියමයන් අනුව සිදු කෙරේ. (මෙම චක්‍රලේඛය www. ugc.ac.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.)

සම්පූර්ණ කළ අයදුම්පත්/ නාම යෝජනා ලේකම්, කළමනාකරණ කමිටුව, මානව සම්පත් අභිවර්ධන ආයතනය, අංක 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනයට 2022 මැයි මස 30 වන දින පස්වරු 3.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ එම කාර්යාලය වෙත ගෙනවිත් භාර දීම සිදු කළ හැකිය. අයදුම්පත්/ නාමයෝජනා බහාලූ ආළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අධ්‍යක්ෂ තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්/ නාමයෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කළමනාකරණ කමිටුවේ ලේකම්
මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
2022 මැයි 09

N & G Ads